මෙහෙක් කතාව

උසස් අධ්‍යපනය අවසානකර රටින් පිටව යන ලෙහිරු හැවන ප්‍රථි පැමිනෙන්නේ අවිශ්වාස අරමුණකිනි පියාගේ යහලුවකු වන පීටර් අන්කල් මුණගැසීමට යන්නේ ඔවුන් වෙනුවෙන් වන පාරසලය බාරදීමටය එහෙත් එය ඔහුට කෙවිවෙන් අමතකවෙයි

අදද එතැන් සිට

Photo : Lyndon Foo

Petahn McKenna

''ඉතින් කොහොමද පුතා සැප සනීප. මොකද මේ ගිය පයින් ආපහු ආවේ.... ලංකාවෙ දේශගුණේ අල්ලන් නැහැ කියල කිතුනද? එහෙම තැත්තම් මෙහෙ දේශගුණේ වැඩිය හොඳයි කියල කිතුන ද?

අන්කල් සිනාසෙමින් ප්‍රශ්න කරයි. අන්කල් එන පොට ඇඟට ඒ තරම් ගුණ නැති බවත් මට සිතෙත්.
''ඔය එතකවත් නෙමෙයි අන්කල්...''
මම ඔහුගේ සිනාවට හවුල් නොවන්නට පරිස්සම් උනෙමි.
''මට තේරැනා... මට තේරැනා...''
ඔහු හිඳ සිටි තැනින් තැනිටවින් මගේ පිටට තට්ටු කරයි. එහෙත් කුතූහලය අවසන් කරගෙන නොමැත.

''ඉතින් මොකක්ද කියමුකො මේ ආපහු ආපු කාරනේ තනහනියක්ම''
''මෙහෙට ආවෙ නම් අන්කල්... පාර්සලය දීල යන්න'' මම වැකියේ අවසන් පද ටික හඬ බාල කර පැවසුවෙමි.
''දවස් ඕල් රයිට් පුතා. ඕක තාමත් හිතේ ද?''
''සොරි අන්කල්..... තාත්තා දානගත්තොත් කණගාටුවෙයි හැබැයි''

''කවු ද ඕව තාත්තට කියන්න යන්නෙ....? දන් මොනවද පුතාට අහෙන් කෙරෙන්න ඕනෙ...? පුතා ආවෙ ටික කාලෙකට වෙන්න ඕනෙන කෑස්ද... කැමති නම් මෙහෙ නවතින්න.''
ඒ කියන මොහොතේම, ඇන්ටි පැණිරස කෑම බන්දේසියක් ද, තේ ද යැගෙන පැමිණියේය. අන්කල් එවර කතාකළේ ඇන්ටිට ය.
''නෑ මන් කිව්වේ ශේස්...ලබිරුට මේ අපේ ගෙදර තවතින්න පුළුවන් මේ ටික දවසට නේද කියල''

''අපෝ මක් වෙනව ද ජානකිත් හරි සතුටුවෙයි ලබිරු පුතා ආව බව දැනගත්තහ ම. එයත් හිතන් ඉන්නෙ අයි ටී කරන්නයි යුති එකේ.... පුතා ඉන්න එක එයාටත් උදව්වක් වෙයි''
'මල කෙලියයි මහ රස කිව්වලු. ඒකටත් එහෙනම් නරක කල දසාවක් ලබාගෙනයි එන්නෙ මං හිතන්නෙ. අයි ටී බෙරගන්න නම් හය කවුරු කවුරු හරි අය ඉඳියි අහල පහල. ඒත් මාව බෙරගන්න වෙන කවුද ඉන්නෙ මම ම ඕසක් ?'

''අයි ටී මම සයිඩ් එකේ කරපු එක විෂයක් විතරයි ඇත්ත්. මම ඩිත්රියට කලේ වෙන එකක්නෙ''
මමත් මොහොට කියනවාදැයි මට ම පැහැදිලි නැත. කොහොම හරි දන්ම ඇඟ බෙරාගැනීම නුවරණට හුරුය.

''ආ ඕව ගැන පස්සෙ කතාකරන්න පුළුවන් ශේස් දුවන් ආවනම්.... පුතා ඒත් තවම කිව්වෙ නැහැනෙ ඇයි පර්ත් ආපහු ආවෙ කියල.''

අන්කල් කරන්නේ මා එක පටලැවිල්ලකින් ගලවා ඒ නුලේ ම වෙනත් ගැටේකට ඇඹරීම ය.
''ඇයි පුතා ඇත්තට ම ආවේ හදිස්සියේ මැ'' ඇන්ටිත් ඊට යහමින් ලුණු ඇඹුල් දමයි.
''හදිසියක් නෙමෙයි ඇන්ටි. මට හිතුන එන්න ඕනෙයි කියල''
'' ඒ කියන්නෙ පී ආර් එක ගන්න වගේ ද?''

ඇන්ටිගේ මොළය යහමින් වැඩ ගත යුතු වැකිය. දන් මටත් පොයක් පැදීගෙන එයි.
''එකත් එකක් තමයි ඇන්ටි. මම හිතුව මෙහෙ රස්සාවක් කරල යහමින් ටිකක් හම්බකරගෙන ම ලංකාවට යන්න''
මා මෙහි එනවිට එවැනි අදහසක් මගේ ගැව්ව්ව් තැනකවත් තිබුණේ නැත. මට ඇත්තේ සාමාන්‍ය ආගන්තුක සංචාරකයෙකුට ලැබෙන ඩබිසඳරද ඩබී බැවින් මාස තුනෙන් පසු මා ලංකාවට ආපසු යා යුතු ය.

''පුතා තව හම්බකරන්න මොකට මහන්සි වෙනව ද....? තාත්ත එහෙ හම්බකලදෙන කියන්නෙ පරම්පරා ගාණකට සල්ලි'' අන්කලුත් අරිත්නේ ම නැත.

''එහෙම තමයි හැදෙන දරුවො. ඔයාල වගේ නෙමෙයි''
අන්කල් රැකියාවක් නොතර රජයෙන් ලැබෙන ආධාර මුදලට ම යටවී සිටීම ශේස් ඇන්ටි කවදත් අනුමත කළේ නැත. මගේ පියා මෙන් ම ලංකාවේ වතු අධිකාරිවරයෙකු වූ ඔහු ලංකාවේ දී ද මහන්සිවී වැඩ කිරීමට පුරුදුවූ කෙනෙක් නොවීය. නිකම්ම ඉඳන් හම්බ කරන්න බලන කෙනෙකුට මේ හරියැන රටක් නොවන බව මම ද දන් අත්දැකීමෙන් දන්නෙමි. ඔහු ඕස්ට්‍රේලියාවට ආවේ ශේස් ඇන්ටිගේ වදේට ඇගේ පවුලේ අයගේ උදව් යටතේ ය. ඒ බවත් ඇය නිතර සිහිකිරීම

මා ඇය දිගු කරමින් තිබූ අත යන්තමට අල්ලාගන්නා ගමන් කීවෙමි. එහි දැනුනු මොලකැටි බව නිසා ම මම ඒ දෙස නිකමට මෙන් බැලුවෙමි.

අන්කල්ට අල්ලන්නේ නැති බව මම හොඳින් දන්නෙමි. මා අහල පහල සිටිනවාට අන්කල් මේ තරම් කැමති, මගේ මාර්ගයෙන් තාත්තා ද ගාවාගෙන ලංකාවේ පම්පෝරි මිතුකරුැනීමට ඔහුට ඉන් පහසුවන බැවිනි. මේ සියල්ල අත්දැකීමෙන් ම පැහැදිලි කරගෙන සිටින මට දෙපාත්තට ම ලකුණු එකතු කරගන්නට ඉඩදෙමින් සිටීම එකටම හොඳ නැති බවත් පල්ලම් බැසීම වඩාත් නුවණට හුරු බවත් පෙනී ගියේය.

''අන්කල් මම දන් යන්න ඕනෙ''
''අයියෝ පුතා දන් කොහෙ යන්න ද...? ඉන්න ඉන්න කෑම කාල යන්න''
''අනේ බැඟැ අන්කල්....අන්කල්ට පුලුවන්ද මාව ස්ටේෂන් එකට දාන්න ?....ඇන්ටි මම යනව''
''අනේ ඉන්න පුතා කෑම කාල යන්න'' ඇන්ටිත් වද කරයි.

''වෙන දවසක එන්නම්. අද හවසට යාලුවෙක් එනව කිව්ව. මිනිහ දන් මඟ ඇති''
මා කියන්නේ බොරුවක් බව මවුනට ද සමහරවිට වැටහෙනවා ඇත.
''එහෙනම් පුතා එන පැටෙඩ් එන්න ඕනෑ එකකට. මෙහෙ නැවතිලා ම යන්න පුළුවන් පුතාට''
''ඔලුමුකො අන්කල්''

සෙනසුරාදාට තව කල් ඇත.

.....

දවසින් දවස මම කාලය මරාදමන්නේ යැයි සිත දොස් නගයි. එහෙත් ආරම්භය සඳහා මා පොටක් පාදාගත යුත්තේ කෙසේ ද කියා සිතා ගැනීම ද, පහසු නොවේ. අද සිතුරාදා ය. මම පර්ත් පැමිණ අඳට දීන දෙකක් ගතවී තිබේ. සේරට ම කළින් තවාතැනක් සොයනත යුතුය. හෝටල් වලට බිල් ගෙවා හොඳට ම ඇති බව සිත සිටී. දෙමිසියන්ගේ මුදල් පුවද නාස්ති කිරීම අපරාදයක් බව මම දනිමි. පත්තරයක් අරගෙන සේරට ම කලින් තවටු නිවාසයක කාමරයක් සොයා ගත යුතු යැයි සිතාගතිමි. ඒ අරමුණින් යුතුව මම ගඟට බැස්සෙමි.

පරණ පුරුදු කඩ ජේලි කිහිපයක්ම මම පසු කලෙමි. හිතට හැඟෙන සුපුරුදු බව මා සතුටට පත් කරයි. මම දිගට ම ඇවිද්දෙමි. මම ඇවිද යන පාර ඉදිරියේ මංසන්ධියකට පැමිණ තිබුනේ මටත් නොදැනුවත් ම ය. පාර හරස් කිරීම සඳහා පිහිටුවා තිබූ බොත්තම අතින් තද කළ මම ඊට ඉඩ සැලසෙන තෙක් තව තවත් සුපුරුදු දසුන් සොයමින් වට පිට බැලුවෙමි. 'ව්ලිත්ස්ත් ස්ට්‍රීට්' මම හරස් කරන පාරේ නාම පුවරුව එළෙසිදී. මේ තම ගෙ වඩාත් හුරු පුරුදු තමන් බව හිතට හඳිසියේ ඇතුළු වූවේ බලාපොරොත්තු නොවූ තැැැන්හේ ද හිතේ තෙතුරුළුමිනි. සිහිවිලි හසුරුවා ගැනීමටවත් ඉඩක් නොතබා මාර්ගය හරස් කිරීම සඳහා වූ සංඥා එළිය ක්‍රියාත්මක වන ලදී. මා සමග එක් රැස්වී සිටි පිරිසක් සමග මම පාර පැන්න ද මගේ දෙපා මා හසුවනු ලැබුවේ මම ගමන් කළ යුතු යැයි සිතා සිටි දිශාවට නොවේ.

පදික වේදිකාව අසලින් තිබූ පරණ පුරුදු පව් පේලිය දිගේ මම ඉහළට නැගුනෙමි. පර්ත් ප්‍රධාන දුම්රිය තැවතුම්පල දෙසට විහිදුනු හරස් මඟ ඔස්සේ මා දෙපසින් ඒරාගෙන ගමන් කරමින් සිටි ගමීන් අතර මම ගෙමින් ඉදිරියට පා තැබුවෙමි. මම පැමිණ ඇති ගමනට අරමුණක් තිබේ යැයි මගේ සිත කියයි. හමුවක් ඒ අරමුණේ අවශ්‍යතාව පිළිබඳව මා තවමත් සිටින්නේ ස්ථිර තීරණයක නොවේ.

දුම්රියේ ගමනට විරුද්ධව ඊට ඉහළින් තනා තිබෙන ගමී වේදිකාව අයිනේ තිබූ කෙටි තාප්ප බැම්මට හේත්තු වී මම පහළ බැලුවෙමි. මේ මට කොතරම් සුපුරුදු තැනක් ද? මට වාතාෂා මුලින් ම මුණගැසුනේ මේ දුම්රියක් තුළ දී ය.

''හලෝ''
''හලෝ''

මා අසල දුම්රියේ අසුන්ගත් සුදු තරුණිය තුළ කිසිම විශේෂත්වයක් මම එදා නොදුටුවේමි . මම එදා ඒ කළේ ඇගේ සුභදශීලීතාවයට සරල ප්‍රතිචාරයක් දක්වීම පමණකි. ඇ ද කළේ ඉන්පසු පොතක් දිගහැර ගැනීම ය.

මම දිගට ම ඉන්පසුව දුම්රිය කවුළුවෙන් පිටත බලා සිටියා මට මතකය. ෆ්‍රිමෙන්ටල් වරාය කිවිටු කරන විට දුම්රිය කවුළුවෙන් පිටත මට මුණගැසෙන දර්ශනය මම කවදත් නැරඹුවේ ඉතා ආශාවකිනි. ඉර එළිය වැදී රිදී පැහැයෙන් බබලන වතුර කඳ, ජන ගුනය වෙරළ තීරුව, කොතරම් වමත්කාර ජනක දර්ශනයක් ද.....?

අවසාන නැවතුමේ දුම්රිය නැවැත්වූ පසුව මම බිම දමා තිබූ බෑගය ද අතට ගෙන නැගී සිටියෙමි. අර සුදු තරුණිය ද මේ තරම් දුරක් මා සමග පැමිණ ඇත. පොත වසා ඇගේ මල්ල තුළට එය ඔබාගෙන හිඳ සිටි තැනින් නැගී සිටීමට ඇය විනාඩියකටත් වැඩි කාලයක් ගත්තේය. මා සිටියේ නොඉවසිල්ලෙනි. මේ මගේ ගමනේ අවසානය නොවේ. විශ්ව විද්‍යාලයට යාම සඳහා මා තවත් ඛසයකට නැග ගත යුතුය. මේ බිමේදී මට නුපුරුදු මේ කලබලයකින් තොර ගතිය තේරුම්ගෙන එයට අනුකරණයවීමට මට ටික කාලයක් ගතවිය.

දුම්රියේ දොරටුව පසුකල හැටියේ ම මම සියලුම මගීන් පසුකර බස්නැවතුම වෙතට දිව ගියෙමි. බස් නැවතුමේ තිබූ කාලසටහනත් අතේ තිබූ මරලොස්සුවත් සංසන්දනය කර බසය පිටත්වීමට තව විනාඩි දහයකටත් වඩා ඇති බව තේරුම් ගත්තත් සැනසුම් සුසුමක් හෙලුවෙමි. මා සිත තුළ හාසයක් තුතකමින් අද සුදු තරුණිය ද ඉතිගමනින් පැමිණ මා අසල නතර විය.
''තව ටික වෙලාවක් තියනව බස් එක පිටත්වුනත්''ඇය පැවසුවේ සිනහවක් ද සහිතවය.
''ඉතින්..... මට ඕන හින්දැයි මම අත්මනව ආවෙ'' මගේ පිළිතුරු හිත ඇතුලේ ම මම තබාගතිමි.

''සොරි මගේ නම ටාතා''
ඇ අත දිගු කරමින් හැවන පැවසුවා ය. ඇ මගේ නිහඬියාව තේරුම්ගෙන ඇත්තේ වැරදි ආකාරයකට ය. මා පැමණ සිටින්නේ නොදිදුණු වුව ද ආචාරධර්ම දන්නා රටක සිටය.

''මම ලිඟරු''
මා ඇය දිගු කරමින් තිබූ අත යන්තමට අල්ලාගන්නා ගමන් කීවෙමි. එහි දැනුනු මොලකැටි බව නිසා ම මම ඒ දෙස නිකමට මෙන් බැලුවෙමි. සුදෝ සුදු ඒ අතේ මම වෙනත් කිසිම වර්ණයක් නොදුටිමි. මා ඊට පෙර මෙවැනි තරුණ යුවතියන්ගේ අත් බොහෝ පිළිගෙන ඇත්තෙමි. එහෙත් ඒ අත්වල දුටු විවිධාකාර වර්ණවත් ලස්සන මේ අතේ මා දුටුවේ නැත.

''ලැ....ඇ...ගි....රු''
ඇය කැඩිච්චිව ඉංග්‍රීසියෙන් මගේ නම නැවත වරක් කීවාය. මේ කරදරයට මා ඊට පෙරද මුහුණ දී ඇත්තෙමි. ඒ හැමවිටක ම කලාක්මෙන් මගේ අකුරින් අකුර මගේ නම හඬනැගන ආකාරය ඇයට පැහැදිලි කර දුනිමි.